# දැන්වීමයි

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ විගණන හා විමර්ශන නිලධාරී තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2018

උතුරු මැද පළාත් විගණන හා විමර්ශන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව එම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2018.08.06 දින වන අතර, ඒ සඳහා බඳවා ගැනීමේ තරග විභාගය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018 සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

**1.0 සුදුසුකම් :**

**1.1 අධ්‍යාපන සුදුසුකම් :**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ විද්‍යාව, රාජ්‍ය මූල්‍ය හා බදුකරණය, ගණිතය, ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් පිළිබඳව විශේෂවේදී උපාධිධරයෙකු වීම

හෝ

II. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) ආවසරික හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත්වීම හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) මධ්‍ය පරීක්ෂණයෙන් සමත්වී තිබීම

හෝ

III. ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ (HNDA) / වාණිජ ඩිප්ලෝමාව සමත්වී තිබීම

**1.2 පොදු සුදුසුකම් :**

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි අයවළුන් විය යුතුය.

III. අයදුම්කරු මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

Iv. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු තුනක (03) ක කාලයක් අඛණ්ඩව උතුරු මැද පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

**සටහන : සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.**

**2.0 වැටුප් පරිමාණය**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ විගණන හා විමර්ශන නිලධාරී තනතුර සඳහා III ශ්‍රේණියේ MN 4 - 2016 වන අතර, මාසික වැටුප් පරිමාණය 31,490/- 445 x 10 - 660 x 11 - 730 x 10 - 750 x 5 - 54,250/- වේ. එම චක්‍රලේඛනයේ II වන උප ලේඛනය අනුව ගැළපුම් දීමනාවක්ද, මාසික ජීවන වියදම් දීමනාවක්ද ගෙවනු ලැබේ.

**3.0 සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි**

(අ) මෙම තනතුර ස්ථිරය. අදාළවන විශ්‍රාම වැටුප පිළිබඳව රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.

(ආ) බඳවාගනු ලබන අයදුම්කරුවන් වසර තුනක පරිවාස කාලයකට යටත් වන්නේය. උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වීම මත හා නිලධාරියාගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමකට පත්වන්නේ නම් වසර තුන අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.

**4.0 විභාග මාධ්‍යය**

මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. කැමති භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකිය. භාෂා මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

**5.0 විභාග ක්‍රමය**

**තෝරා ගැනීමේ තරග විභාගය**

විභාගය ප්‍රශ්න පත්‍ර පහකින් සමන්විත වේ.

**5.1 ලිඛිත විභාගය :**

| විෂයයන් | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රතිශතය |
|---|---|---|
| **මූල්‍ය ගණකාධිකරණය** | 100 | 40% |
| **පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය** | 100 | 40% |
| **විගණනය හා විමර්ශනය** | 100 | 40% |
| **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය** | 100 | 40% |
| **අවබෝධය හා බුද්ධි පරීක්ෂණය** | 100 | 40% |

**විභාගය සඳහා විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **විෂයය අංක 01 - ගණකාධිකරණය** | ගණකාධිකරණ න්‍යාය - මූලික සංකල්ප හා මූලධර්ම, වත්කම් ඇගයීමේ ක්‍රම, ද්විත්ව සටහන් න්‍යාය, පිරිවැය වර්ගීකරණය, ශේෂ පත්‍රවල තොරතුරු වර්ගීකරණය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය.<br>● ගණකාධිකරණ පද්ධති - ගිණුම් ඒකකයක උපයෝගී කරගනු ලබන සම්පත්වල වෙනස්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාව පදනම් කරගත් පාලන සංකල්ප පිළිබඳ අවබෝධය, ප්‍රමිතයන් සමග සැසඳීමේ අවශ්‍යතාව, ව්‍යාපාරික ගණුදෙනු විශ්ලේෂණය, මිලදී ගැනීම, වෙළඳම, මුදල් ලැබීම් හා ගෙවීම්, ඉන්වෙන්ට්‍රි පාලනය ආදී මූලික කළමනාකාරිත්ව කාර්යභාරයන්ට අදාළ පරිපාටි පිළිබඳ නිපුණතාව, දෛනික පොත් ලෙජර්, පාලන ගිණුම් ආදී වාර්තා සැලසුම් ආකෘති පිළිබඳ නිපුණතාව.<br>● ශේෂ පත්‍ර සකස් කිරීම, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම්, සැසඳීම් ප්‍රකාශ, පාලන ගිණුම්,<br>● ගණකාධිකරණ ප්‍රමිත | පැය 03 | 100% |
| **විෂයය අංක 02 - පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය** | පිරිවැයකරණ මූලධර්ම, පිරිවැයකරණ වර්ග, මිලදී ගැනීම් හා ගබඩා පරිපාටි, ද්‍රව්‍ය, ද්‍රව්‍ය මිල කිරීම, ද්‍රව්‍ය නිකුතු මිල කිරීම, වේතන, පොදු කාර්ය පිරිවැය, ස්ථාවර හා විචල්‍ය වියදම්, සෘජු හා වක්‍ර වියදම්, අයවැය ලේඛනමය පාලනය, ප්‍රමිත පිරිවැයකරණය, විචලනයන්, ආන්තික පිරිවැයකරණය. | පැය 03 | 100% |
| **විෂයය අංක 03 - විගණනය හා විමර්ශනය** | විගණන සංකල්ප හා න්‍යාය, විගණනයක අවශ්‍යතාව, ගණන්දීමේ වගකීම විගණනයේ පදනමක් වශයෙන් විගණන විෂය පථය, විගණන වර්ග, විගණන කාල නිර්ණය, විගණකවරුන්ගේ සුදුසුකම්, බලතල, විගණනය සඳහා අධිකාරී බලය, පූර්ව විගණනය, අභ්‍යන්තර පාලනය, ගැඹුරින් විගණනය, අභ්‍යන්තර විගණනය, ප්‍රමිත සඳහා වන අවශ්‍යතාව, විගණනය සඳහා සාක්ෂි වර්ග, ශිල්පීය ක්‍රම<br>● විගණන ප්‍රමිත<br>● විගණන පද්ධති සහ පරිපාටි, ශේෂ පත්‍රය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම්, ඉඩම්, ගොඩනැගිලි, ස්ථාවර වත්කම්, ඉන්වෙන්ට්‍රි, මුදල්මය වත්කම්, විකුණුම්, මිලදී ගැනුම්, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩසටහන් පිළිබඳ නිපුණතාව.<br>● විගණන ගැටලු - නිරීක්ෂණ හැකියාවන් සහ වැරදි සහ අසාමාන්‍ය අවස්ථාවන් සොයා බැලීමේ හැකියාව පිරික්සීම සඳහා වන සරල ගැටලු<br>● විගණකාධිපතිවරයාගේ කාර්යයන්<br>**විමර්ශන :**<br>විමර්ශනයට අදාළ විෂය ක්ෂේත්‍රය සැලසුම් කිරීම, භාවිතා කළ යුතු ශිල්ප ක්‍රම හා පිළිවෙත්, විමර්ශන මෙහෙයවීමේ අභිප්‍රාය පිළිබඳ උදහරණ - ශක්‍යතා අධ්‍යයන, මිලට ගැනීම්, විකුණුම්, ණයට දීම්, මිල නියම කිරීම ආදිය සඳහා ව්‍යාපාර ආයතන ඇගයීම, කාර්ය පත්‍රය සඳහා ගණකාධිකාරීගේ හා විගණකගේ වාර්තා, වාර්තාකරණ කාර්යයන්, වංචා විමර්ශන, ව්‍යාපෘති ඇගයීම<br>**වාර්තාකරණ කාර්යයන් :**<br>අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා කළමනාකරණයට වාර්තා කිරීම, රජයේ හා සංස්ථා විගණනයට විශේෂ වාර්තාකරණ කාර්ය පත්‍රය සඳහා වාර්තා, විමර්ශනය පිළිබඳ වාර්තා. | පැය 03 | 100% |

| | | | |
|---|---|---|---|
| **විෂයය අංක 04 -<br>රාජ්‍ය මූල්‍ය කළමනාකරණය** | **රජයේ මුදල් පිළිබඳ නෛතික රාමුව :**<br>ඒකාබද්ධ අරමුදල, විශේෂ නිති විෂයගත වියදම, ප්‍රතිශ්චිත අවසාන අරමුදල, රාජ්‍ය ණය, විදේශ ආධාර.<br>**කාර්යභාරය :**<br>පාර්ලිමේන්තුවේ, මුදල් අමාත්‍යවරයාගේ, භාණ්ඩාගාරයේ, විගණකාධිපතිවරයාගේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ, ප්‍රධාන ගණක නිලධාරියාගේ.<br>අයවැය ක්‍රමය හා පරිපාටි / වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු, අයවැය ක්‍රියාත්මක කිරීම, අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ව්‍යූහය, ආදායම් රාශිකරණ පටිපාටිය, ගෙවීම් කිරීම සඳහා අග්‍රිමය විරමොං පරිපාටිය, පරිපූරක ඇස්තමේන්තු, අයවැය පාලනය, ආදායම් හා අතිකුත් ලැබීම් සඳහා ගිණුම්කරණය, වියදම් හා අතිකුත් ගෙවීම් සඳහා ගිණුම්කරණය, විදේශ ආධාර සඳහා ගිණුම්කරණය, පාඩු අත්හැරීම හා කපා දැමීම සඳහා ගිණුම්කරණය. | පැය 03 | 100% |
| **විෂයය අංක 05 -<br>අවබෝධය හා<br>බුද්ධි පරීක්ෂණය** | **"අ" කොටස - අවබෝධය**<br>දෙනු ලබන ඡේදයක් පදනම් කොටගෙන අයදුම්කරුවන්ට ප්‍රශ්න යොමු කරනු ලැබේ. දෙනු ලබන තවත් ඡේදයක්, අයදුම්කරුවන් විසින් එහි මුඛ්‍ය අදහස ඡේදයේ වචන ගණනින් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවිය යුතුය.<br>**"ආ" කොටස - බුද්ධි පරීක්ෂණය**<br>පදයක, සංඛ්‍යාත්මක හා රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනය හා ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුලින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම අපේක්ෂා කෙරේ. | පැය 02 | 100% |

## 6.0 අයදුම්පත්‍ර :

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ 4 (සෙ.මි. 21X30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමුවන පිටුවටද, අංක 04 සිට 07 දක්වා ශීර්ෂ දෙවන පිටුවටද, අංක 08 සිට 11 දක්වා ශීර්ෂ තෙවන පිටුවටද ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදාළ තොරතුරු පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.nc.gov.lk මගින්ද භාගත හැකිය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.08.06 වන දින හෝ ඊට පෙර, **"ලේකම්, උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, අනුරාධපුරය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උතුරු මැද පළාතේ විගණන හා විමර්ශන නිලධාරි තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2018" යනුවෙන් සඳහන් කළ යුතුය. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

(ඇ) අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යයෙනි.

(ඈ) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඉ) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් හැර වෙනත් අයදුම්කරුවන් විසින් අයදුම්පතේ සඳහන් අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් තම නිල මුද්‍රාව සහිතව සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඊ) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරවා ඉදිරිපත් කළ යුතුය.

## 7.0 විභාග ගාස්තු

(අ) විභාග ගාස්තුව රුපියල් එක් දහසකි. (රු. 1000/- කි) මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ එදිනට පෙර උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට උතුරු මැද පළාත් සභාවේ පොදු තැන්පත් ගිණුමට බැර වන ලෙස ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන අංක එන්සී 100 දරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ. විභාග ගාස්තු ගෙවනු නොලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය)

(ආ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. තවද, අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

- (i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
- (ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශ පත්‍ර නොලද හොත් එම අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලිඛිතව හෝ දුරකථන අංක ඔස්සේ දැන්විය යුතුය.

- (i) විභාගයේ නම
- (ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම
- (iii) සම්පූර්ණ ලිපිනය
- (iv) අයදුම්පත් තැපැල් කළ කාර්යාලය, ලියාපදිංචි කළ අංකය හා දිනය

අයදුම්පත්‍ර නොලැබී හෝ අස්ථානගත වීමක් හේතුවෙන් විභාග ප්‍රවේශ පත්‍ර නොලැබී ගියහොත් ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට අයදුම්පත්‍රයේ පිටපතක් සමග ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපතක් රැගෙන උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයට අයදුම්කරුම පැමිණිය යුතුය.

## 8.0 තෝරා ගැනීමේ ක්‍රමය :

(අ) ලිඛිත විභාගය සමත් ලෙස සළකනු ලැබීම සඳහා එක් එක් විෂය සඳහා 40% ට වඩා ලකුණු ප්‍රතිශතයක් ලබාගත් අයදුම්කරුවන් ඔවුන් ලබාගත් සමුච්චිත ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙළ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හි සඳහන් විධිවිධාන අනුව දිස්ත්‍රික් අනුපාතය පදනම් කර ගනිමින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% ක් සඳහා සුදුසුසන් බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ. මෙම තනතුරේ දැනට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 21 කි. අයදුම්කරුවන් අතුරින් තරග විභාගයෙන් උපරිම ලකුණු ලබාගත් අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ආ) පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා දැන්වීම් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

## 9.0 සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වීමට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

## 10.0 අනුකූලභාවය :

මෙහි සිංහල හා දෙමළ මාධ්‍යය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

මෙම දැන්වීමෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අධිතියද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අධිතිය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.

**ලේකම්,**
**උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු මැද පළාත.**
**2018.07.04**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

# උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## උතුරු මැද පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ විගණන හා විමර්ශන නිලධාරී තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2018

## අයදුම්පත්‍රය

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල - 2, දෙමළ - 3)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

1.1 මුල'කුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

(උදා : GUNAWARDHANA H.M.S.K.)

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..............................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්) : ..............................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................

3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2018.08.06 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..............................

3.5 දුරකථන අංකය : ..............................
ස්ථාවර : .............................. ජංගම : ..............................

3.6 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) (ඇත්නම්) : ..............................

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :

| විභාග වර්ෂය : | | විභාග අංකය : | |
|---|---|---|---|
| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
| 1. | | 3. | |
| 2. | | 4. | |

4.2 උපාධිය පිළිබඳ විස්තර / ලබා ඇති වෘත්තීය සුදුසුකම් :

| විශ්වවිද්‍යාලය / නිකුත් කළ ආයතනයේ නම | උපාධිය / ඩිප්ලෝමා / වෘත්තීය සහතිකයේ නම | ප්‍රතිඵල වලංගු වන දිනය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

5.0 අදාළ වෙනත් සුදුසුකම් (ඇත්නම්) : ..............................

6.0 ඔබ කවරදක හෝ සාපරාධී චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කර තිබේද ? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න)

ඉහත පිළිතුර 'ඔව්' නම් විස්තර සපයන්න : ..............................

(ඒ බැව් සනාථ කරන ලිපි අමුණන්න)

**7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :**

7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය : ..............................
7.2 ලදුපත් අංකය හා දිනය : ..............................
7.3 ගෙවූ මුදල : ..............................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
(ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගන්න)

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්,

8.1 දෙපාර්තමේන්තුව / ආයතනය : ..............................
8.2 දැනට දරන තනතුර : ..............................
8.3 මුල් පත්වීම් දිනය : ..............................
8.4 සේවා කාලය : අවු. : ..............................
8.5 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග : ..............................

**9.0 අයදුම්කරුගේ ප්‍රකාශය**

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තුව ගෙවූ .............................. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක .............................. හා .............................. දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම එකග වෙමි.

දිනය : .............................. ..............................
අයදුම්කරුගේ අත්සන

**10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................. මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, .............................. වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය : .............................. ..............................
සහතික කරන්නාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය : (නිල මුද්‍රාව තබන්න)

(පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් තොරතුරු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

**11.0 දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා / මිය / මෙනවිය .............................. කාර්යාලයේ / ආයතනයේ .............................. දින සිට .............................. තනතුරක සේවය කරන බවද, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිබවද / කළ නොහැකි බවද ඔහු / ඇය මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවද සහතික කරමි.

දිනය : .............................. ..............................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නම :
තනතුර :
(නිල මුද්‍රාව තබන්න)